// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2301/58 - 2022 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2022.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(4) වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් පත් කරන ලද රාජ්‍ය අමාත්‍යවරුන් වෙත විෂයයන් සහ කාර්යයන් පැවරීම වහාම ක්‍රියාත්මක වන පරිදි මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
ජනමාධ්‍ය අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 14 වැනි දින,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 05.

1A - G 37785 — 08 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

**ගරු ශාන්ත බණ්ඩාර, ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ජනමාධ්‍ය විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම<br>2. මෙම *ගැසට් පත්‍රය* මගින් පවරා දෙනු ලබන ජනමාධ්‍ය අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම<br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම<br>4. ජනතාවගේ දැනුම ආකල්ප හා රසඥතාවය දියුණු කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික දියුණුව සඳහා ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සම්පාදනය කිරීම<br>5. රජයේ මුද්‍රණ හා ප්‍රකාශන කටයුතු<br>6. නවතම තාක්ෂණය සහ කළමනාකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් විවිධත්වය තුලින් ව්‍යාපාර අරමුණු කරගත් නවීන තැපැල් සේවයක් ලබාදීම සහ දේශීය හා විදේශීය තැපැල් සේවා කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම<br>7. ලංකා මුද්දර කාර්යාංශය පරිපාලනය කිරීම<br>8. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලු විෂයයන්ට අදාළ කටයුතු<br>9. II තීරුවෙහි දැක්වෙන ආයතන අධීක්ෂණය කිරීම | 1. තැපැල් දෙපාර්තමේන්තුව<br>2. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව<br>3. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය | 1. මුද්දර ආඥාපනත (1909 අංක 22)<br>2. තැපැල් කාර්යාල ආඥාපනත (1908 අංක 11)<br>3. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත (1984 අංක 18) |

EOG 10 - 0129

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.